**ජා-ඇල නගර සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 08 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජා-ඇල නගර සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී පරිත්‍යාග වශයෙන් ලද රු.18,345,000 ක් වටිනා මෝටර් රථ 02 ක වටිනාකම හා රු.55,495 ක් වටිනා පුස්තකාල පොත් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගතකොට නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වටිනාකම රු.37,169,422 ක් වුවත්, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම සහ පරිත්‍යාග යන ගිණුම් 02 එකතුව රු.37,052,047 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කළ වටිනාකම රු.1,306,560 ක් වුවද, වර්ෂයේ වියදම් ගිණුම් විශ්ලේෂණයට අනුව ප්‍රාග්ධනිත කළ වටිනාකම රු.1,262,765 ක් විය.

(ඈ) 2015 වර්ෂයේ ගිවිසුම් අත්සන් කරන ලද රු.1,215,642 ක් වටිනා කර්මාන්ත 02 ක් සඳහා ණයහිමි වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවේ දක්වා තිබූ පරිදි මන්ත්‍රීවරුන්ගේ දුරකථන ගාස්තු වෙනුවෙන් ලැබූ රු.25,352 ක් තැන්පත් ගිණුමට බැරකර තිබුණ අතර, එම මුදල ඉකුත් වර්ෂයේ වැය ශීර්ෂවලින් දැරූ වියදම් විය. සමාලෝචිත වර්ෂයේදීද එම ලැබූ මුදල් තැන්පත් ගිණුමෙන් නිරවුල් කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීම් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ලෙස රු.316,609 ක් ගිණුම්වල දක්වා තිබුණද, ආයතනය බදු සඳහා ලියාපදිංචිය අවලංගු කර තිබූ බැවින් සාවද්‍ය වගකීමක් ගිණුම්වල දක්වා තිබුණි.

(ඌ) පොදු වෙළඳපල අංක 40 ඌරුමස් වෙළඳසැලේ 2015 පෙබරවාරි මාසයේ කුලිය රු.45,875 ක් අඩුවෙන් බිල්කිරීම නිසා ලැබිය යුතු කඩකුලී ආදායම හා ආදායම් වියදම් ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) ලැබිය යුතු විනෝද බදු රු.1,883,222 ක් බිල් කළ යුතු වුවත්, රු.1,687,245 ක් ලෙස බිල් කිරීම හේතුවෙන් ආදායම් වියදම් ගිණුම හා ලැබිය යුතු විනෝද බදු ගිණුම රු.195,977 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබූ වෙළඳ ස්ථාන කුලී ආදායම රු.1,897 ක් වුවත්, ගිණුම්වල කලින් ලැබූ බදුකුලී ලෙස රු.134,395 ක් දක්වා තිබුණ බැවින්, ඉදිරියට ලැබූ කඩකුලී ආදායම් ගිණුම රු.132,498 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය සඳහා කර්මාන්ත 03 ක් වෙනුවෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.1,709,764 ක් 2016 වර්ෂයේ ලැබී තිබුණද, එම මුදල ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඕ) ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර වශයෙන් 2014 වර්ෂයේ සිට ගිණුම්වල දක්වා තිබූ රු.6,204,193 ක් නොලැබෙන මුදලක් හෙයින් එම වටිනාකමින් ගිණුම්වල ව්‍යාජ වත්කමක් නිරීක්ෂණය විය.

(ක) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු කසල බැහැර කිරීමේ ගාස්තු රු.93,540 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ග) 2015 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් ගිණුම අනුව ශේෂය රු.31,759,726 ක් වූ අතර, බැංකු ස්ථාවර තැන්පතු අලුත් කිරීමේ නිවේදනය අනුව ශේෂය රු.29,670,727 ක් වූයෙන් රු.2,088,999 ක වෙනසක් විය.

1.3.2 තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

-----------------------------------------------

එකතුව රු.47,127,372 ක් වූ ගණුදෙනු සඳහා ලේඛණ සහ උපලේඛණ ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

ගිණුම් විෂයයන් 05 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.15,310,679 ක් වූ අතර, ඒවාට අදාළ උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.18,320,028 ක් වූයෙන් රු.3,009,349 ක වෙනසක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) රඳවාගත් ස්ථාවර තැන්පතු ගිණුමේ ලැබිය යුතු ශේෂය වූ රු.46,863 ක් වර්ෂ 05 ක කාලයක සිට නොවෙනස්ව පවතින අතර, එය නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් ණයහිමි ශේෂය වූ රු.1,826,536 ක් වර්ෂ 03 ක කාලයක සිට නොවෙනස්ව පැවතුන අතර, එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වියදම් ණය හිමියන් සඳහා පසුගිය වර්ෂයේ සිදුකල වෙන්කිරීම් වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් අඩුකල පසු රු.23,470,782 ක් පෙර වර්ෂය සඳහා තවදුරටත් ගෙවිය යුතු ලෙස නිරූපණය වූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.එම වටිනාකම සඳහා උපලේඛණයක්ද ඉදිරිපත් කොට නොතිබුණි.

1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) නගර සභා ආඥා පනතේ (255) අධිකාරය) 170(1), 170(2) වගන්ති ප්‍රකාරව අයවිය යුතු බදු හා දඩ මුදල් ආදිය අයකර නගර සභා අරමුදලට බැර කිරීම සඳහා පියවර ගැනීම ලේකම්ගේ කාර්යය වුවද, රු.16,872,919 ක හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා වරෙන්තු බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(ආ) නගර සභා ආඥා පනතේ (255) අධිකාරය) 170 (අ) (1) වගන්තිය ප්‍රකාරව රු.18,817,812 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) (අ) (ඇ) ප්‍රකාර අතුරු අග්‍රිම ලබාදීමේදී මාණ්ඩලික තත්ත්වයේ නිලධාරින්ට පමණක් සීමා විය යුතු වුවද, සභාව විසින් රු.95,301 ක් වූ අතුරු අග්‍රිමයක් සැපයුම්කරුවන්ට ලබාදී තිබුණි.මෙම මුදල වසර 9 සිට 16 දක්වා අධික කාලයක සිට නිරවුල් නොවී පැවතුණි.

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.51,471,375 ක් වූ අතර ,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.19,177,998 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000` | රු. 000 ` | රු. 000` |
| (i) | වරිපනම් හා බදු හා වරෙන්තු ගාස්තු | 20,770 | 19,769 | 16,873 |
| (ii) | බදු කුලී | 9,905 | 7,405 | (1,553) |
| (iii) | බලපත්‍ර ගාස්තු | 528 | 879 | 116 |
| (iv) | වෙනත් ආදායම් | 40,211 | 56,039 | 8,002 |

2.2.2 වරිපනම් බදු අයකිරීමේ ප්‍රගතිය
------------------------------------

වර්ෂය අවසාන වනවිට දේපල තහනම් කිරීමේ නිලධාරින් සේවයේ නොසිටි අතර, 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා හිඟ මුදල් අයකර ගැනීමේ ප්‍රගතිය 0% සිට 11% දක්වා ඉතා දුර්වල තත්ත්වයක පැවතුනි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 අධිකාරි බලය නොලත් ගණුදෙනු
--------------------------------------

(අ) ස්ථාවර තැන්පත් ලෙජර් ගිණුම හා උපලේඛණ අතර ආරම්භක ශේෂ වෙනස රු.4,089,963 ක් හඳුනා ගැනීමකින් හා අනුමැතියකින් තොරව ජර්නල් සටහන් අංක 15 මගින් සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.

(ආ) සේවක ඇප ආයෝජන ගිණුම හා උපලේඛණය අතර, ආරම්භක ශේෂ වෙනස රු.11,615 ක් හඳුනාගැනීමකින් තොරව ජර්නල් සටහන් අංක 17 මගින් සේවක ඇප ආයෝජන ගිණුමට හරකර තිබුණි.

3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

(අ) සභාවේ සමාලෝචිත වර්ෂයේ මහජන බැංකු ජංගම ගිණුමේ රු.13,659,283 ක සාමාන්‍ය මාසික මුදල් ශේෂයක් පවත්වා තිබුණද, සභාව විසින් මෙම අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) ලංකා බැංකු ජංගම ගිණුමේ රු.580,530 ක ශේෂයක් වර්ෂ 04 ක් පුරාම නිෂ්කාර්යව පවතින අතර, මෙම මුදල් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කිරීමට සලකා බලා නොතිබුණි.

(ඇ) හිඟහිටි විදුලිය ගාස්තු ශේෂය වූ රු.1,110,620 ක මුදල දිගින් දිගටම පැවතෙන අතර, එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙය පෞද්ගලික විදුලිය සමාගමට පැවරූ වත්කම් හා විදුලිය ගාස්තු අයකිරීමේ අයිතිය පැවරීමක් නිසා ලැබිය යුතු මුදලක් වූ අතර, මෙවැනිම ගණුදෙනුවක් පැලියගොඩ නගර සභාව විසින් සාකච්ඡා කොට කොටස් සහතිකයක් ලබාගෙන ඒ සඳහා වර්ෂයකට රුපියල් ලක්ෂකයට වැඩි ලාභාංශ ප්‍රමාණයක් ලබාගෙන තිබූ හෙයින් එවැනි ආයෝජනයක් සඳහා සභාවේ බලධාරීන් ගේ අවධානය යොමුවී නොතිබුණි.

3.3 කාර්ය සාධනය

-----------------

නගර සභා බල ප්‍රදේශය තුල ඇති පුද්ගලික මාර්ග හඳුනාගෙන ඒ සම්බන්ධ ලේඛණයක් සකස් කර නොතිබූ අතර, කාණු පද්ධතිය නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල කිසිඳු කාණු පද්ධතියක් සකස් කිරීමක් හෝ පිළිසකර කිරීමක් කර නොතිබුණි.

3.4 කොන්ත්‍රාත් පාලනය

-----------------------

නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 38 වගන්තිය අනුව රුපියල් දස දහස ඉක්මවන වියදමක් (යම් කාර්යය කිසිවක් සඳහා) ගිවිසුමක් ලියවිල්ලක් බවට පත් කළ යුතු අතර, එහි 40 වගන්තිය අනුව යම් වැඩක් ක්‍රියාත්මක කිරීම සඳහා සේවකයන් හෝ බඩු ද්‍රව්‍ය සැපයීම සඳහා රුපියල් දස දහස (10,000) ඉක්මවන වියදම් සඳහා ප්‍රචාරක දැන්වීම් මගින් ටෙන්ඩර් කැඳවිය යුතු නමුත්, රු.388,670 ක කර්මාන්ත වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී එසේ සිදුකර නොතිබුණි. තවද එම කර්මාන්ත වෙනුවෙන් ප්‍රමාණ වාර්තා හා ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව ටෙන්ඩර් කැඳවා ටෙන්ඩර්කරුගේ ප්‍රමාණ වාර්තා හා ඇස්තමේන්තු මත ටෙන්ඩර් භාරදී තිබුණි. කර්මාන්ත බොහොමයක අවසාන මිනුම් වාර්තා දක්වා නොතිබුණි.

3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දින සිදුකළ පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව.35,405 ක් වටිනා පොත් 228 ක් අස්ථාන ගතවූ බව වාර්තා කොට තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) ආරක්ෂක සේවා පවත්වාගෙන යාම සඳහා ඇති කරගෙන තිබූ ගිවිසුමේ 15 වෙනි වගන්තිය අනුව යොදවනු ලබන කණිෂ්ඨ ආරක්ෂක නිලධාරීන් මනා පෞරුෂත්වයකින් යුතු වයස අවුරුදු 50 නොඉක්මවූ අය විය යුතු අතර ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරීන් ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවාවෙන් නීත්‍යානුකූලව ඉවත් වූ අය විය යුතු වුවත් එලෙස බඳවාගත් බවට සාක්ෂි නොතිබුණි.

## 3.6 ඝන අපද්‍රව්‍ය කළමණාකරණය

----------------------------------

බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ 2008 ජුලි 30 දිනැති අංක 1560/6 දරණ ගැසට් නිවේදනයේ පළ කර ඇති , 2008 අංක 01 දරණ "ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීති" ප්‍රකාරව සියලුම පලාත් පාලන ආයතන ක්‍රියාත්මක කළයුතු බවට 2010 දෙසැම්බර් 21 දිනැති අංක එල්ජීඩි/05/08/පොදු /වෙළම හා පළාත් පාලන කොමසාරිස් (බස්නාහිර පළාත) ලිපියෙන් දැනුම් දී තිබුණද එම රීති මාලාවේ අංක 18(1), 19,22,54 හා 59 අනුව ගාස්තු කිසිවක් අයකර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

( අ) ගිණුම්කරණය.
(ආ) අභ්‍යන්තර විගණනය.
(ඇ) ආදායම් පරිපාලනය.
(ඈ) කොන්ත්‍රාත් පාලනය.